**පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

**වෙත යොමු කරන ලද**

**ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත**

**සම්බන්ධයෙන්**

**පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව**

**පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ**

**පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති**

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම. විසිනි**

**2026 ජූනි මස 12 වැනි සිකුරාදා**

---

**சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவிற்கு**
**ஆற்றுப்படுத்தப்பட்ட**
**தேசிய சூழல் (திருத்தச்) சட்டமூலம்**
**மீதான**
**சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் அறிக்கையானது**
**சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் தவிசாளர்**
**பாராளுமன்ற உறுப்பினர் கௌரவ ஹெக்டர் அப்புஹாமி அவர்களால்**
**2026 யூன் மாதம் 12 ஆம் திகதி வெள்ளிக்கிழமை பாராளுமன்றத்தில்**
**சமர்ப்பிக்கப்பட்டது.**

---

**Report of the**

**Sectoral Oversight Committee on Environment, Agriculture and Resource Sustainability**
**on**

**National Environmental (Amendment) Bill**

**referred to**

**Sectoral Oversight Committee on Environment, Agriculture and Resource Sustainability**

**Presented to Parliament by**

**Hon. Hector Appuhamy, M.P.**

**Chair of the**

**Sectoral Oversight Committee on Environment, Agriculture and Resource Sustainability on**

**Friday 12 June 2026**

## කාරක සභාවේ වාර්තාව

2026 ජූනි මස 09 වන දින පාර්ලිමේන්තුවේ දී රැස් වූ පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පහත සඳහන් පනත් කෙටුම්පත සලකා බලන ලදී.

- ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත

  (2026 මැයි මස 06 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

**සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්:**

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම., (සභාපති)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා, පා.ම.
ගරු කිංස් නෙල්සන් මහතා, පා.ම.
ගරු උපුල් කිත්සිරි මහතා, පා.ම.
ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය, පා.ම.
ගරු සුසන්ත කුමාර නවරත්න මහතා, පා.ම.
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා, පා.ම.
ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.
ගරු කිට්නන් සෙල්වරාජ් මහතා, පා.ම.
ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා, පා.ම.

**සහභාගී වූ කාරක සභික නොවන මන්ත්‍රීවරුන්:**

ගරු අජිත් ගිහාන් මහතා, පා.ම.

**කාරක සභාවේ ලේකම්**

කලංසූරිය ප්‍රියන්ත චන්දන මහතා, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)

**සහභාගී වූ නිලධාරීන්**

**පරිසර අමාත්‍යාංශය**

ආර්. පී. එස්. යූ. ජයරත්න මහතා, අතිරේක ලේකම් (පාලන)
ආර්. එච්. එම්. පී. අබේකෝන් මහත්මිය, අතිරේක ලේකම් (පරිසර ප්‍රතිපත්ති සැලසුම්)
දිනේෂිකා සී. ජයවර්ධන මෙනෙවිය, නීති නිලධාරි
ක්‍රිෂාන්ති හෙන්නායක මහත්මිය, සහකාර අධ්‍යක්ෂ - නීති

**මධ්‍යම පරිසර අධිකාරිය**

මහාචාර්ය තිලක් හේවාවසම් මහතා, සභාපති
ආර්. එස්. පී. කපිල රාජපක්ෂ මහතා, අධ්‍යක්ෂ ජනරාල්
ජී. ආර්. ඩී. එන්. අත්තනායක මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
එච්. එල්. කමල් ප්‍රියන්ත මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
එස්. එම්. ඒ. සේනානායක මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
එස්. පී. පෙරියප්පෙරුම මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

**නීතිපති දෙපාර්තමේන්තුව**

ආචාර්ය අවන්ති පෙරේරා මහත්මිය, නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

එම්. පී. කුලරත්න මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක

**හැඳින්වීම**

මධ්‍යම පාරිසරික අධිකාරියක් පිහිටුවීම සඳහා ද එම අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා ද පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස, සම්මත කරන ලද 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

**කාරක සභා නිරීක්ෂණ**

1. මධ්‍යම පරිසර අධිකාරිය ශ්‍රී ලංකාව තුළ විශාල කාර්යභාරයක් ඉටු කරන ආයතනයක් වන බැවින් තීරණ ගැනීමේදී විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥ දැනුම සහිත පුද්ගලයන් අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සිටීමේ වැදගත්කම සලකා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව 3 සිට 5 දක්වා ඉහළ නංවන බව
2. මධ්‍යම පරිසර අධිකාරිය විසින් උපාය මාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රමවේදය භාවිතා කරන ලද නමුත් ඊට අදාළ නෛතික ප්‍රතිපාදන ලැබෙනුයේ මෙම සංශෝධන මගින් වන බව
3. පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීමේ බලය පමණක් මෙතෙක් මධ්‍යම පරිසර අධිකාරියට තිබූ අතර මෙම සංශෝධන මගින් විධාන නිකුත් කිරීමේ බලය ලැබෙන බව
4. භාණ්ඩ නිෂ්පාදනය තුළින් ජනිත වන කසළ කළමනාකරණය පිළිබඳව වගකීම මෙතෙක් නිෂ්පාදකයාට නොතිබූ අතර ඒ සම්බන්ධව වගකීම පැවරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේ බලතල මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා දී ඇති බව
5. තම බල ප්‍රදේශය තුළ පවතින පාරිසරික ගැටළු නියාමනය කිරීමට පළාත් පාලන ආයතන විසින් පියවර නොගන්නා අවස්ථාවල සහ විධාන නිකුත් කොට ඒවා පැහැර හරින අවස්ථාවල නඩු පැවරීමේ බලතල මධ්‍යම පරිසර අධිකාරිය වෙත පවරා ඇති බව
6. කර්මාන්තයක් ආරම්භ කිරීමෙන් පසු ලබා ගන්නා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර වෙනුවට කර්මාන්තයක් ආරම්භ කිරීමට පෙර පරිශ්‍ර නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබා ගතයුතු වන බවට සංශෝධන ඇතුළත් කර ඇති බව
7. කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට මෙන්ම එම බලපත්‍ර අත්හිටුවීමට ද මධ්‍යම පරිසර අධිකාරියට බලතල තිබිය යුතු බව
8. රසායනික ද්‍රව්‍ය සහ උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් නව නීතිමය ප්‍රතිපාදන ඇතුළත් කර ඇති බව සහ ඒ සඳහා පිහිටුවීමට නියමිත විද්වත් තාක්ෂණික කමිටුව ඉතා කාලෝචිත වන බව
9. මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලිඛිතව වාර්තා ඉල්ලා සිටීමේ බලතල සහ පරිසර ආරක්ෂණ ප්‍රදේශයක පවතින අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීමේ බලතල ලබා දී ඇති බව

ඒ අනුව, කාරක සභාව ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත, අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කිරීමට නියමිත කාරක සභා අවස්ථාවේ සංශෝධන සඳහා නීතිපතිවරයාගේ අනුමතිය ලබාදීමට යටත්ව අනුමත කරන ලදී.

**කාරක සභාවේ තීරණ**

ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත කාරක සභාවේ දී සලකා බලා ඒ සම්බන්ධයෙන් එකඟ වූ අතර, ඒ පිළිබඳව සකස් කරන ලද කාරක සභාවේ මෙම වාර්තාව කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් 2026 ජූනි 12 වැනි සිකුරාදා දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන ලදී.